වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය - 2014

-------------------------------------------------------------------------

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතියේ (ඩීඑස්ඩබ්ලිව්ආර්පීපී) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර එළඹි 2006 මාර්තු 16 දිනැති අංක කිව් 5200 දරන ණය ගිවිසුම, 2006 අගෝස්තු 28 දිනැති අංක ටීඑෆ් 056901 දරන ප්‍රදාන ගිවිසුම සහ 2008 මැයි 01 දිනැති අංක සීර් 4406 දරන මූල්‍ය ගිවිසුම සඳහා වූ පොදු කොන්දේසිවල 4.09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------------

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතියේ ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, එවකට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, වර්තමානයේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ (අ) වේලි ආරක්ෂණ හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම් (ආ) ජල කාලගුණික තොරතුරු පද්ධති නවීකරණය හා ඉහළ නැංවීම සහ (ඇ) බහු - ආංශික ජල සම්පත් සැලසුම්කරණයයි. ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,217.29 කට සමාන එජඩො මිලියන 72.21 ක් වන අතර ඉන් සියයට 91.23 ක් නියෝජනය වන රු.මිලියන 7,494.07 කට සමාන එජඩො මිලියන 65.88 ක් මූල්‍යායනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 ජුනි 30 දින ආරම්භ කරන ලද අතර 2013 ජුනි 30 වනවිට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවුවද 2011 ජුලි 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයට අනුව, ව්‍යාපෘතියේ කාලය 2015 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

මූල්‍යායන සැලැස්ම

----------------------

ණය ගිවිසුම අනුව, දේශිය අරමුදල්ද ඇතුළත්ව ව්‍යාපෘතියේ මූල්‍යායන සැලැස්ම පහත දැක්වෙන පරිදි එජඩො මිලියන 72.21 ක් විය.

| ගිවිසුම | වර්ගය | විගැහි (SDR) මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
|---|---|---|---|---|
| ජා.සං.ස - සීර් - 4406 | වැඩ | 18.70 | 29.72 | 3,395.59 |
| කිව් - 5200 ණය | උපකරණ හා වාහන ඇතුළත් භාණ්ඩ, උපදේශක සේවා සහ පුහුණුව | 18.77 | 29.84 | 3,409.30 |
| | වර්ධක මෙහෙයුම් පිරිවැය | 0.88 | 1.40 | 159.95 |
| | ව්‍යාපෘති සැකසීමේ අත්තිකාරම ආපසු ගෙවීම | 0.32 | 0.51 | 43.07 |
| | වෙන් නොකරන ලද | 2.43 | 3.86 | 441.02 |
| | උප එකතුව | 41.10 | 65.33 | 7,448.93 |

| | | | |
|---|---|---|---|
| ජා.සං.ස - ටීඑෆ් 056901 | උපදේශක සේවා | 0.50 | 41.04 |
| ප්‍රදාන | භාණ්ඩ, පුහුණු හා වර්ධක මෙහෙයුම් පිරිවැය | 0.05 | 4.10 |
| ශ්‍රී ලං ර | | 6.33 | 723.22 |
| එකතුව | | 72.21 | 8,217.29 |

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

---

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.මිලියන 938.45 ක දේපල, පිරියත හා උපකරණ පිරිවැය, අනුරූපී විස්තරවල දැක්වෙන එකතුව රු.මිලියන 1,013.43 ක වත්කම් වටිනාකම සමඟ ගැලපී නොතිබුණි. තවද විවිධ ආංශික ජල සම්පත් සැලසුම් යටතේ භූගත ජලය නියාමන පද්ධතියේ භාවිතය සඳහා 2012 වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් රු.මිලියන 83.87 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන 04 ක්, දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වනු වෙනුවට නිමකරන ලද වැඩ වටිනාකම යටතේ අඛණ්ඩව දක්වා තිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---

3.1 අරමුදල් උපයෝජනය

---

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය/ප්‍රදාන ගිවිසුම්වලට අනුව සැපයීම සඳහා එකඟ වූ මුදල | | අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2014 දෙසැම්බර් 31 දක්වා** | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ජාසංස | 65.88 | 7,494.07 | 1921.00 | 14.92 | 1,920.69 | 57.64 | 7,028.36 |
| ශ්‍රී ලං ර | 6.33 | 723.22 | 350.00 | 1.73 | 224.96 | 6.99 | 826.29 |
| එකතුව | 72.21 | 8,217.29 | 2,271.00 | 16.65 | 2,145.65 | 64.63 | 7,854.65 |

3.2 භෞතික ප්‍රගතිය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වේළි ආරක්ෂණ හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සංරචකය යටතේ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් 31 කින් කොන්ත්‍රාත් 19 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. වේළි ආරක්ෂණය හා කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ කාර්යයන් සඳහා වූ අතිරේක වැඩ සඳහා කොන්ත්‍රාත් 12 ක් රු.මිලියන 612.7 ක පිරිවැයකට ප්‍රදානය කර තිබූ අතර ඉන් කොන්ත්‍රාත් 2 ක් 2015 ජුනි 18 දිනට සියයට 30 කට අඩු

මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. තවද ව්‍යාපෘතියේ කටයුතු 2015 ජූනි 30 දිනට නිමකිරීමට අපේක්ෂා කර තිබුණද පොල්ගොල්ල හා නාච්චදූව ජලාශ වේළිවල අමතර පිළියම් වැඩ සඳහා කොන්ත්‍රාත් 2 ක් 2014 දෙසැම්බර් මාසයේදී ප්‍රදානය කර තිබූ අතර 2015 ඔක්තෝබර් වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි.

(ආ) ජාතික ජල භාවිත සැලැස්ම, යාවත්කාලීන කරන ලද මහවැලි ජල සම්පත් සංවර්ධන සැලැස්ම හා මුන්දෙනි ආරු ද්‍රෝණි සංවර්ධන සැලැස්ම ආදී සංවර්ධන සැලසුම් ව්‍යාපෘතිය විසින් රු.මිලියන 479 පිරිවැයකට 2013 වර්ෂයේදී පිළියෙල කර තිබුණද එම සැලසුම් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට 2015 මැයි 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) බහු - ආංශික ජල සම්පත් සැලසුම්කරණය යටතේ පූර්ව ශක්‍යතා අධ්‍යයනයන් ව්‍යාපෘතිය විසින් සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඒ සඳහා වෙන් කර තිබූ රු.මිලියන 187 ක මුදලක් උපයෝජනය කිරීමෙන් තොරව පැවතුණි.

(ඈ) ජලාශ කිහිපයක වේළිවල පිළියම් වැඩ සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා රු.මිලියන 491 ක ඇස්තමේන්තුගත පිරිවැයකට විදේශීය උපදේශක සමාගමකට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර උපදේශක සමාගම විසින් එකඟ වූ පරිදි ඒ පිළිබඳ පිරිවැය ඇස්තමේන්තු පිළිබඳ වාර්තා ඉදිරිපත් කර තිබුණි. කෙසේවුවද රු.මිලියන 612.7 ක් වූ වේළි පිළිබඳ අතිරේක වැඩ ව්‍යාපෘතිය විසින් පසුව හඳුනා ගෙන තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් රු.මිලියන 170.4 ක පිරිවැයකට එක්ස්කවේටර් 03 ක්, ටිපර් 08 ක් හා ඒරියල් ප්ලැට්ෆෝම් යන්ත්‍ර 03 ක් ප්‍රසම්පාදනය කර තිබුණු බව නිරීක්ෂණය විය. කැමැත්ත පිළිබඳ ප්‍රකාශන කැඳවීමට පෙර එම යන්ත්‍රවලින් අරමුණු කළ උපයෝජනයන් විධිමත්ව හඳුනාගෙන නොතිබූ අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපයෝජනය සඳහා ඉඩ හැර තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

නාලන්දා වේල්ලේ පිළියම් වැඩ සඳහා රු.මිලියන 382.99 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2013 මැයි 28 දින ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිරිවැය ඇස්තමේන්තුව අනුව, නාලන්දා වේල්ලේ පිළියම් වැඩ පිළිබඳ මුළු පිරිවැය රු.මිලියන 267.9 ක් විය. කෙසේවුවද 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 254.5 ක් වටිනා විචලන නියෝගයන් කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබුණි. තවද නව ගිවිසුමකට එළඹීමට කටයුතු කිරීමෙන් තොරව රු.මිලියන 160.38 ක පිරිවැය වූ අළුතෙන් හඳුනාගන්නා ලද නව වැඩ පවත්නා කොන්ත්‍රාත්තුවේ විචලනයන් ලෙස වර්ගීකරණය කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 32.08 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන්ගේ පහසුකම් සැපයීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී මසකට රු.මිලියන 2.5 ක් බැගින් වූ මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි. කෙසේවුවද ඒ පිළිබඳ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.5 මූල්‍ය පාලනය පිළිබඳ කරුණු

---

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2013 හා 2014 වර්ෂ සඳහා පවත්වන ලද සමීක්ෂණ මණ්ඩල පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

3.6 මානව සම්පත් කළමනාකරණය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් උපදේශක තනතුරු අනුමත කර නොතිබුණද, ව්‍යාපෘතිය විසින් කෙටිකාලයක් සඳහා උපදේශකවරු දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි. කෙසේවුවද ඔවුන් සඳහා කිසිදු නිශ්චිත පැවරුමක් හෝ රාජකාරි ලැයිස්තු ආදිය නිකුත් කර නොතිබුණි. තවද එක් උපදේශකවරයකු ප්‍රසම්පාදන විශේෂඥගේ ප්‍රසම්පාදන සහකරු ලෙස සේවය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද සපුරා නොතිබූ ඉංජිනේරුවන් දෙදෙනෙකු හා ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු 2014 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි බඳවා ගෙන තිබුණි.

3.7 නොවිසඳී ඇති විගණන ඡේද

---

මාගේ පෙර විගණනයෙන් පහත සඳහන් කරුණු පෙන්වා දී ඇති නමුත්, 2014 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(අ) සේනානායක සමුද්‍රය, සමනල වැව හා වික්ටෝරියා ජලාශවල වේළි සම්බන්ධයෙන් පවත්නා ගැටලු පිළිබඳ විශේෂ අධ්‍යයනයන් සිදු නොකිරීම.

(ආ) පොල්ගොල්ල උමඟ සම්බන්ධයෙන් පිළියම් වැඩ පිළිබඳ පර්යේෂණ සිදු නොකිරීම.

(ඇ) ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල පරිශ්‍රයන්හි උපයෝජනය නොකරන ලද වත්කම් පැවතීම.

(ඈ) ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා විදේශ ගමන් දීමනා වැඩිපුර ගෙවීම.